# LIS Research Symposium – 2008

## *Libraries for Development*

**Abstracts**

*01st March 2008*

*Library and Information Science Alumni Association*
*Department of Library and Information Science*
*Faculty of Social Sciences*
*University of Kelaniya*
*Sri Lanka*

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි මධ්‍යගත පුස්තකාලයන්ට අමතරව පීඨ/දෙපාර්තමේන්තු පුස්තකාල ආරම්භ කිරීම

අනුෂා සචිවනී රුබසිංහ,
සහකාර පුස්තකාලයාධිකාරී
පර්යේෂණ පුස්තකාලය
සමාජීය විද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

1921 දී කොළඹ යුනිවර්සිටි කොලීජිය ස්ථාපිත කිරීම මගින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ආරම්භ විය. මුලාරම්භයේදී විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඉතා සුළු පිරිසකට සීමා වුවද එම අවස්ථාවේ සිටම විශ්වවිද්‍යාල පුස්තකාල ද ආරම්භ විය. ආරම්භක අවස්ථාවේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ක්‍රමයෙන් වර්ධනය වී ඒවායෙහි අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන්ගේ ප්‍රමාණය ඉහළ යාමත් සමඟ පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම විද්‍යාත්මක හා විධිමත් ස්වරූපයකින් එම පහසුකම් සැපයීමද අවශ්‍ය වී තිබුණි. එවැනි තත්ත්වයක් තුළ විශ්වවිද්‍යාල පුස්තකාල පද්ධතිය ඉතා වේගයෙන් වර්ධනය වීමක්ද ඒ හා සාපේක්ෂව විශ්වවිද්‍යාල පුස්තකාල සේවාව සඳහා පවතින ඉල්ලුමේ සංකීර්ණ ස්වරූපයක්ද දක්නට ලැබේ. මෙම තත්ත්වයට අනුකූලව විශ්වවිද්‍යාල පද්ධතියේ සේවා සැපයීම සම්බන්ධයෙන් ආයතනික ස්වරූපයෙන් සිදු වූ වෙනස්කම් සලකා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

දත්ත රැස්කිරීමේදී ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතියික දත්තද භාවිත කළ අතර අහඹු ලෙස තෝරාගත් විශ්වවිද්‍යාල 04 ක් යටතේ තොරතුරු ලබා ගන්නා ලදී. ඒ අනුව පේරාදෙනිය පුස්තකාලයෙහි ප්‍රධාන පුස්තකාලයට අතිරේක වශයෙන් පීඨ පුස්තකාල 05 ක්ද රුහුණු විශ්වවිද්‍යාලයෙහි 03 ක්ද කොළඹ විශ්වවිද්‍යාලයෙහි 03 ක්ද කැලණිය විශ්වවිද්‍යාලයෙහි 03 ක්ද ස්ථාපිත කර ඇත.

මධ්‍යගත පුස්තකාල මගින් පමණක් තවදුරටත් පුස්තකාල සේවා සැපයීම විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අපහසු වී ඇතිබව පැහැදිලි විය. විශ්වවිද්‍යාල තුළ උගන්වනු ලබන පාඨමාලා ප්‍රමාණය මෙන්ම විෂය ක්ෂේත්‍රයන්ද ඉතා විශාල ලෙස ඉහළ යාම් විශ්වවිද්‍යාලයන්හි පීඨ සහ දෙපාර්තමේන්තු ප්‍රමාණය ඉහළ යාම මෙන්ම ඒවා අතර විෂය සම්බන්ධතා දුරස්ථ වීම එක් විශ්වවිද්‍යාලයක් තුළ මණ්ඩප පීඨ සහ දෙපාර්තමේන්තු විවිධ භූමි ප්‍රදේශවල පිහිටුවා තිබීම වැනි තත්ත්වයන් තුළ මධ්‍යගත පුස්තකාලයකින් පමණක් තවදුරටත් පුස්තකාල සේවා සැපයුම පවත්වාගෙන යාමට නොහැකි පසුබිමක් නිර්මාණය වී තිබේ. විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීමේදී එය කුඩා පරිමාන මට්ටමකින් ආරම්භ කිරීම නිසා මධ්‍යගත පුස්තකාල මගින් පුස්තකාල සේවාව සැපයීමට හැකි වුවද විශ්වවිද්‍යාලවල අධ්‍යයන ක්ෂේත්‍ර සහ ශිෂ්‍ය ප්‍රමාණය පුළුල් වීමත් සමග පීඨ සහ දෙපාර්තමේන්තු මට්ටමින් පුස්තකාල ආරම්භ කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. ලබාගත් තොරතුරු වලට අනුව විශ්වවිද්‍යාලයන්හි මධ්‍යගත පුස්තකාලයන්ට අමතරව පීඨ/දෙපාර්තමේන්තු පුස්තකාල ආරම්භ කිරීමේ ප්‍රවණතාවක් ඇතිව තිබෙන බව පැහැදිලි විය. පීඨ/දෙපාර්තමේන්තු පුස්තකාල ආරම්භ කිරීම තුළ පුස්තකාල සේවාව කාර්යක්ෂම කළ හැකි වීම, පුස්තකාල සම්පත් වැඩි දියුණු කිරීම, පර්යේෂණ කටයුතු සඳහා මනා පිරිවහලක් ලබා ගත හැකි වීම, නඩත්තු කිරීමේ පහසුව, පරිශීලනයට ඇති ඉඩකඩ සහ එහි ප්‍රයෝජන, ප්‍රවේශවීමට ඇති පහසුව සහ එහි ප්‍රතිඵල, කාල කළමනාකරණය, පීඨයන් විශ්වවිද්‍යාලයෙන් පරිබාහිරව පිහිටීම සහ එමගින් ලැබෙන පිරිවහල යනාදිය දැක්විය හැකිය.